"කාලයකින් මොනවත් කරන්න ලැබුණෙත් නෑ නේද?හාන්කවිසියක් වත් මතක නැතව ගිය හැටි..."
"පින් හොඳ වෙලාවට මතක් කළේ..." පන්හිඳ ඉද්ද ගැහුවා වගේ නැගිටින ගමන් කිව්වා.
"මොනවද තවත් බලා ඉන්න..? හැබැයි ඉතින් කට ගැස්මක් තමයි.."
"ආ ඒක ගණන් ගන්න එපා.. පළවෙනි වතාව ටිකක් සැරට දාගත්තම රට ජාතිය ආයම භාෂාව වගේ දේවල් නිකම්ම කට ගැස්මක් වනවා.." පන්ට ටිකක් වැඩිවුණා ම මව් බසයයි මතක්වෙන්නෙ.

කොහොමින් කොහොමින් හරි හැනදැජාමෙ වෙන-කොට දෙන්නා එක පිළිවෙලක් වුණා. ලියන්න කියන්න මොන තරම් පණ්ඩිත ගොල්ල උන්නත් භාෂාව මරන්නම තමයි පන් ට ඕන.
"ලූලා නැති වලට කනයා
පණ්ඩිතයා ය කිව්වලුනේ.."
පින් කිව්වා.
"තුන් තේරවිලි කියන්ට නම් එපා.." පන් තමන්ට ලියැවුණු පද වැලක මුල ජේලිය තාලයකට කියන්න පටන් ගත්තා.
"තේරවිල්ලක් නෙවෙයි අයිසේ ඒක. රූසියක්.. දන්න තරම තමයි ඔය.." පින්ට හොඳටම කේන්තියි.
"ඉතින් අපි දන්න තේරවිලි ගැන කතා කරමු?" පන් ඇඳුවෙ හරහට වගෙයි.
පින්සලයේ කෙඳි ටික කෙළින් වුණා "..ඉන්න තන්තෙ හැටියට මොනවා ලියයිද මේ හාදයා..."



කිසිවෙකුගේ නිසි අවධානයට යොමු නාවුණ ද සිංහල බස් වහරේ එන රසවත්ම අංගයකි තේරවිලි මීන් පර ලිපිසකින් ප්‍රවිෂ්ඨය සැපයූ තේරවිලි පිළිබඳ කතිකාවත තව දුරටත් ගෙන යාම අපගේ පාඨක දනන්ගේ සිත් පහන් කරවන්නට සමත් වෙතැයි සිතමු. .. පන්හිඳ ලියන්න පටන් ගත්තා. කාලා බීලා ඉන්න වෙලාව හින්දා කොයිකටත් පින්සල පන්හිඳ ළඟට තීන්ත බොඳ වෙන කඩදාසියක් ළං කළා. මේ වාගෙ වෙලාවට අකුරු වලට වචන වලට සෑහෙන්න කැපුම් කෙටුම් ලබන්න වෙනවා. පින් ටිකක් දුරින් බලාගෙන උන්නා.

සිංහලය මෙන්ම හින්දි පාලි වැනි භාෂාවන් ගණනාවක්ම ජනිත කරමින්ට පාලක වූ සංස්කෘත භාෂාවේ ද අංගයක් වන තේරවිළි වල වචනත් ගැඹුරු වූ අංගය ස්ලෝක වැනි දෙයින් අර්ථාන්විතය. මුඛ පරම්ප-රාවෙන් ප්‍රචනගෙන ආ සිංහල වෙදකම එවන ස්ලෝකවලින් නිර්මිතය. මොඹෙධ වට්ටෝරු ඉතා සංක්ෂේප ලෙසත් ආකර්ෂනීය ලෙසත් සැකසී පරම්ප-රාවෙන් පරම්පරාවට වනපොත් වීම අපගේ උරුමයන්ග් අපූර්වත්වය කියා පානා තපත් එක් නිදසුනක් පමණකි. ඇතැම් විට මොඹයය පිළිබඳ රහස්‍ය භාවයත් ගුරු මුෂ්ඨියත් රැකීමට හේතු වූයේ ද ඒවායේ මේ සැඟවුණ ස්වභාවයයි.

මුල් ලිපියක ලියැවුණා සේ අකුරක් මාරු කිරීමෙන් ඇරඹෙන සිංහල වහරේ එන තේරවිලි කුඩා ළමුන් සඳහා වූ සරළ තේරවිළි මෙන්ම වැඩිහිටියන් සඳහා නිර්මාණය වූ තුන් තේරවිලි දක්වා පරාසයක විහිද යයි.

ඇඟ සුදු පාටයි හොට රතු පාටයි
පි පී ගානවා කියන්න මගෙ නම

ඒ කුඩා දරුවන් සඳහා මෑත යුගයක නිර්මාණය වූවකි. එය ම මඳක් වර්ධනය කෙරෙමින් සාමාන්‍ය දැනුම විමසා බැලෙන අන්දමේ තෙරවිලි කීපයකි මේ.

අලියා නොකන දල්ල - ගිනි දල්ල
අලියා නොකන මඟ - ඉණිමඟ
කාගෙත් මල්ලී - කොත්තමල්ලි
නවීට නැති ගෙඩිය - බිත්තරය
නැට්ට නැති කොලය - කඩදාසිය
පුංචි ලිඳේ වතුර රසයි -කුරුම්බා ගෙඩිය
ගහක් උඩින් මුවෙක් පැන්නා- කහෙල්මුව
ගෙදරම තියෙන ගෙඩිය. - වංගෙඩිය

සිසිර දිසානායක

තනි කකුලෙ සුද්දා. - ගිනිකුර
අකුලන්න බැරි පැලුර - මහපාර

මීට වඩා දිර්ඝව විස්තර කෙරෙන තේරවිලි කීපයකි මේ.
1 බඩක් උඩ බෙල්ලක් බෙල්ලක් උඩ කොප්පියක්
2 සාක්කුවෙන් පිටට පනී පස් දෙනෙකුම බදා ගනී.
3 ඕනෑ කොට පේන්නෙ නෑ පේන කොට ඕනෙ නෑ
4 අඟුරු කකා වතුර බී බී කොළඹ දුවන යකඩ යකා.
5 එපා වෙනකොට ළඟට ගන්නවා ඕනෑ වෙනකොට විසිකරනවා.

බෝතලය, ලේන්සුව, මිනීපෙට්ටිය, අඟුරු කෝච්චිය, නැංගුරම තේරුම් කරන්නට ඉහත දැක් වූ වදන් වල යම් කිසි රිද්මයක් ද අන්තර්ගත වීම විශේෂයෙකි ක්‍රමයෙන් වර්ධනය වන්නාවූ තේරවිලි කවි බවට පත් වීමේදී නිතැතින්ම හිමි විය යුතු වූ ලක්ෂණයකි ඒ

ළමා වැඩිහිටි දෙපකයෙටම කුතූල දනවන්නා වූ තව දුරටත් වර්ධනය වූ ත්‍රේරවිලි කීපයක් පිළිබඳව සිතා බලමු

1 ටක් ගානවා - ටිකක් කනවා
ටික් ගානවා - දොර වහනවා
- කිල්ලෝටය
2 වක්ක වකයි - වක දෙවකයි
වත්තක පොල් ඔක්කොම කයි
- හිරමනය
3 අත්තෙන අත්තට පනින කුරුල්ලා
බිමට වැටුණ විට වොහොර
කුරුල්ලා
- වැහි බින්දුව
4 බිම දුඹුරුයි - ඉහළ සුදුයි
වෙල් එළියේ නිතර සිටියි
- කොකා
5 ගලක් පලා ගලක් දුටින්
එගල පලා දියර දුටින්
දියර පලා ඊදි දුටින්
- පොල් ගෙඩිය

වඩාත් කවි වල රූපය ගන්නා වූ බොහෝ විට එළි සමය පවා රැකි ඉතාම කෙටි වූ පහත දැක්වෙන තේරිලි සිංහල ජන කවියාගේ නිර්මාණශීලීත්වය අපූරුවට කියා පාන්නක් නොවේ ද?

උඩිනුත් ගින්දර - යටිනුත් ගින්දර
මැද්දෙ දවුන්දර - කන්නෙ පාන්දර
- ආප්ප
වැල් වැල් දික් ඇති - මල් මල් රුව ඇති
රාජ වංශ ඇති - කෑවොත් පණ නැති
- නියඟලා
පොත්ත නිල්වන් - මදේ සුදු වන්
අනේ මේකිගෙ - බඩේ දරුවන්
- ගස් ලබු
කිරිගස් හතරයි - පරගස් හතරයි
වකුටු දෙකයි - බොකුටු දෙකයි
දික් දිගට එකයි - එළඳන

ඉහවහා ගිය පාන්ඩිත්‍යයෙන් ඔද්දල් වූ හිස් කුහර වල අවධානයට බඳුන් නොවුවද නිර්ව්‍යාජ ගැමි වහරෙන් පිළිපන් මෙවන් නිර්මාණ වල නිර්මලත්වය තක්සේරු කළ නොහේ ගැමි සුවඳ වහනය වන සුන්දර ගැමි වදන් වලට පෙම් බඳින්නන් අමන්දානන්දයට පත් කරවන මෙවන් සම්පත් වලින් කෙරෙන නිර්මාණ ලඝු කොට තකන්නේ කුමන වූ මානසිකත්වයක්දැයි සිතා ගැනීමට පවා නොහැකි ය

"ඕනෑම දෙයක් ඕනෑවට වඩා ඕනෙම නෑ කියනවාලු නේ..." පන්හිඳ කොලයෙන් අහකට තුඩ ගත්තා.
"තව කේච්චර දේවල් තියෙනවද?" පින්ට ටිකක් මදි වගේ. මුට්ටියෙන් පතුල පෙනන නොපෙනෙන ගානට ඇවිත්.
"ආයෙ දවසක බැරියැ තව නේද?" පන් කිව්වා.
"නමුත්නැගේ නම් ලියයි. මම අඳින්න මොනවද?" පින් ට සිහි එලවා ගන්නත් බැරි ගානයි.
"තේරවිල්ලක්ම අඳිනවා.." පන් කිව්වෙ සවුත්තුවට වගේ.
"ඒක හැබැයි.. මාසයක් ම යාවි තෝරගන්ට.." පින් අවසිහියෙන් වාගේ එහාට මෙහාට කෙඳි ඇඟිල්ලුවා

අපේ ටිකිරන්ට ටිකිරියන්ට මේ වගේ තේරවිලි පන්සියයක් එකතු කරලා ලේපියලි පොතක් කරපු ප්‍රේම දිසානායක මහත්තැන්ටත් පින් ලැබෙන්න ඕනෙ මේ කළ පුණ්‍යකර්මයට පන් තමන්ටම කියා ගත්තා.

■

මා ඉතින් යන්න යනවා ගීතය .ලොග් සටහනක් වගේ ද?

සුනිල් එදිරිසිංහ සමඟ සොඳුරු නිමේෂයක්

යහපත් සමාජයක් බිහිකිරීමෙහිලා කලාකරුවෙකුට සිය කලාකෘතිය තුළින් සමාජයට කළ හැකි බලපෑම කවරාකාරද? එය සමාජයක් ගොඩනැගීමෙහිලා ද, සමාජ පරිහාණිතයටද, එකසේ දායක කරගත හැකිය. එදින් සුනිල් එදිරිසිංහයන් මෙතෙක් බිහිකළ සිය නිර්මාණ ගොන්න දෙස බැලූ කලද, පසක් වන්නේ ඔහු ගැයූ සෑම ගීතයකින්ම යහපත් සමාජ ආකල්ප බිහි කිරීමට ඉවහල් වූ සෙයකි. ශ්‍රී ලාංකික ගීත ක්ෂෙත්‍රය තුළ ප්‍රතාපවත් පෞරුෂයක් ඇති සුනිල් එදිරිසිංහයන්ගේ නවතම ගීත එකතුව ,අලුත් වැස්සක්, තුළින්ද, ගම්‍ය වන්නේ ඉන් ලද හැකි යහපත් සමාජ පූර්වාදර්ශයන්මය. මෙයින් සුනිල් එදිරිසිංහයන් තමා එළි දැක්වූ නවතම ගීත එකතුව නිමිති කර පැවැත්වූ සංවාදයකි.

ප්‍ර : ,අලුත් වැස්සක්, ගීත එකතුව ගැන මොකද හිතන්නේ ?
පි : මට විශ්වාසයි. මා මෙතෙක් කළ සෑම නිර්මාණයක් වගේම මේ ,අලුත් වැස්සක්, ගීත එකතුවත් සාර්ථක වෙනවා කියලා.
ප්‍ර : මොන පදනමකින්ද, ඔය සාර්ථකත්වය ගැන විශ්වාසය තියන්නේ ?
පි : කලාකරුවෙක් හැටියට මේ රටේ රසිකයින්ගේ රසිකත්වය ඉවෙන් වටහාගත් කලාකරුවන් කිහිප දෙනා අතරේ, මමත් එක්සෙනෙක්ක ඒ නිසා උසස් රසිකත්වයක් ඇති පිරිසක් මා වටා ඉන්නවා. ඔවුන් නිසා තමයිත මම අද ක්ෂේත්‍රයේ රැඳිලා ඉන්නේ. ඔවුන් කෙරේ තබා ඇති විශ්වාසය පදනම් කරගෙනයිත මගේ සාර්ථකත්වය මම තීරණය කරන්නේ.
ප්‍ර : මෙතෙක්කළ නිර්මාණ දිහාබලලුවම එකම පිරිසක්නේද ඔබ වටා ඉන්නේ ?
පි : නැහැ. "අලුත් වැස්සක්" ගීත එකතුවේදී මා ගැන දැරෑ ඒ අදහස සම්පූර්ණයෙන්ම බිඳලා තියෙනවා. මෙතෙක් මගේ නිර්මාණයකට දායක නොවුණු දර්ශන රචන්ද දිසානායක, රුවන් ශ්‍රී වල්පොල, උපාලි ජයලත් යන නවකයන් මේ ගීත එකතුවේදී මම දායක කර ගත්තා.

ප්‍ර : මෙම ගීත එකතුවෙන් රසික අවධානය වඩාත්ම යොමු කරවන්න උත්සාහ ගන්නේ කුමන ගීත වලදවුද ?
පි : පොදුවේ ගත්තම හැම ගීතයකින්ම සමාජයට යහපත් පණිවිඩයක් දෙන්න මම උත්සාහ කළා. එයිනුත් රත්න ශ්‍රී යටත් විජිතවාදය ගැන ලියූ ,සුද්දො ආවේ රට කරන්න, ඒ වගේම පරයේ විශ්‍රාමිකයින් පිළිබඳව ලියවුනු ,පැන්ෂොන් දිනය වැටෙනවා මායේ අතට, සුනිල් ආරියරත්නයන් ඇත් පරලුර ගැන ,ලියූ බෝසත් කුල ඇතානෝ, සුනිල් සරත් පෙරේරා ලියූ ,රා.....රා.....රා..... බොම්බියේ, වැනි ගීත විශේෂයි.

ප්‍ර : ඔබ මොන තරම් සමාජ යහපතට ගී ගැයුවත් මාධ්‍ය තුළින් මේවා ජනතාව අතරට ගෙන නොගියොත්, ඉන් පළක් වන්නේ නැහැනේ ?
පි : ඔය ප්‍රශ්නෙට අද බොහෝ ශිල්පීන් මුහුණ දීලා තියෙනවා. මේකේ භයානකකම තමයි රසිකයින්ගේ හොඳ රසිකත්වය මොට කරල යමක් ගැන පරිකල්පන බුද්ධියකින් හිතන්න බැරි මහා අඳාන පිරිසක් බිහිවීම. මෙහිදී වගකිව යුත්තන් බොහෝ දෙනෙක් නිහඬයි.

ප්‍ර : ඒ වුණාට මාධ්‍ය කියන්නේ රසිකයින් ඉල්ලන දේ දෙනවා කියලයි ?
පි : නැහැ. ඒක බොරුවක්. රසිකයෝ ඉතාම අහිංසකයි. ඔවුන් දකින්නේ මො-නවද? ඔවුන්ට ඇසෙන්නේ මොනවද? ඒ තුළ ඔවුන් ඇලී ගැලී ඉන්නවා. ඔවුන් ඉල්ලන දේ නොවෙයි දිය යුත්තේත සනාවට දියයුතු දේ දෙන්න ඕනෑ. හැඳෙදන වැඩෙන දරුවෙක් වස විෂ ඉල්ලුවට දෙමාපියන් ඒ දරුවට වස විෂ දෙනවාද? නැහැනේ. ඒක තමයි දෙමව්පියන්ගේ තියෙන දරු කැක්කුම. ඒ වගේ වගකිව්යුතු අස්තන් සමාජයට දයාබරිතව ඉන්න ඕනෑ. සමාජය තමන්ගේ දරුවා ලෙස දකිනවා නම් කවදාවත් සමාජයට නොහොබිනා දේවල් එන්නේ නැහැ. මේවට වගකියන්න ඕනෑ අපේ රට කරවන දේශපාලකයෝ.

ප්‍ර : ඇයි ඔබ දේශපාලකයන්ට දොස් කියන්නේ, මාධ්‍යනේ මේවා කරන්නේ ?
පි : ඇයි? මාධ්‍ය පාලනයක් කරන්න මේ දේශපාලකයන්ට බැරි. පටු ආකල්ප දරණ බලයට කෑදර පිල් බෙදුනු දේශපාලකයෝ ඕසක් ,මේ රට මගේය. රට වැසියා මගේ දරුවන්ය,. කියක කැක්කුමක් ඇති එක දේශපාලකයෙක් හරි ඉන්නවානම්, ඔහුට පුලුවන් මාධ්‍ය පාලනය සියතට ආරගෙන මේ සමාජයට නොහොබිනා දේවල් ගලායාම නවත්වන්න. එහෙම පියවරක් ගත්ත එක දේශපාලකයෙක්වත් ඕෂත කාලයේ බිහිවුණේ නැහැ.

ප්‍ර : ඔබ ඔහොම කීවට එවැනි දේශපාලකයන් වෙනුවෙන් පෙනී සිටින කලාකරුවොත්, අද ඉන්නවනේ ?
පි : ඒ අය කලාකරුවොදැ? කියලා තවත් එක සැරයක් හිතන්න. ඔය ලද බොළඳ දේශපාලකයෙකුට වඩා කලාකරුවා ගඳී ගණනක් ඉදිරියෙන් ඉන්නේ. කලාකරුවා කියන්නේත ඔහත් අභිමානයක් ඇති සමාජයටම වැඩදායක උතුම් පුද්ගලයෙක්.

ප්‍ර : ඔබ කියන්නේ කලාකරුවෙකුට දේශපාලනය අකැපයි කියලා ?
පි : නැහැ. මම එහෙම කියන්නේ නැහැ. රටේ පුරවැසියන් හැටියට ඔවුනුත් යම් දේශපාලන මතයක් දැරිය යුතුයි. ඒ නිසා කලාකරුවා කියලාත ඔහුට ඉන් ඕදෙන්න බැහැ.
ප්‍ර : එහෙම නම්, ඔබ මොන දේශපාලකයාද? ඔය ගැන දැනුවත් කරලා තියෙන්නේ ?